# 8 රාජ්‍ය පාලනය, ආර්ථිකය හා සදාචාරය

කිසියම් රටක පාලනය හා එහි ආර්ථික තත්ත්වය එකිනෙක හා ඉතා සම්බන්ධ ය. පාලකයන් නිවැරැදි ආකාරයෙන් රට පාලනය කරන විට හා ඔවුන් නිවැරැදි ආර්ථික ප්‍රතිපත්ති අනුගමනය කරන විට ජනතාවගේ ආර්ථික තත්ත්වය ඉහළ යයි. එසේ නොවන විට රටෙහි ආර්ථික තත්ත්වය පිරිහී ජනතාවගේ ජීවිතයෙහි ගුණාත්මක අගය පහළ යෑම ද වැළැක්විය නො හැකි ය.

රාජ්‍ය පාලනය හා ආර්ථිකය ජනතාවගේ සදාචාරය කෙරෙහි ද විශාල බලපෑමක් කරයි. පාලකයන් වැරැදි ප්‍රතිපත්ති අනුගමනය කරන විට ආර්ථිකය පිරිහෙන අතර, පිරිහුණු ආර්ථිකයක් ඇති විට එබඳු සමාජයක සාමාජිකයන්හට සදාචාර සම්පන්න වීමට ඇති ඉඩ ඉතා අඩු ය.

සදාචාර සම්පන්න සමාජයක් බිහි කිරීම තම අවසාන පරමාර්ථය සේ සලකා ක්‍රියා කළ බුදුරදුන් මහජනතාවගේ මනා පාලනය ද ආර්ථිකය ද කෙරෙහි අවධානය යොමු කිරීමේ හේතුව ඔබට තේරුම් ගත හැකි ය. මනා රාජ්‍ය පාලනය සඳහා අදාළ වන්නා වූ අගනා ඉගැන්වීම් රාශියක් ද, මනා ආර්ථිකයක් දියුණු කිරීම සඳහා ඉවහල් වන ඉගැන්වීම් හා ආකල්ප රාශියක් ද බුදු දහමෙහි ඇත.

මෙම පාඩමෙන් අප හදාරනුයේ බුදුරදුන් විසින් දේශනා කරන ලද රාජ්‍ය පාලන හා ආර්ථික සංවර්ධන ඉගැන්වීම් ය. පළමු වන පාඩම් ඒකකයෙන් රාජ්‍ය පාලනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ද, දෙවැන්නෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳ බෞද්ධ ඉගැන්වීම් ද හදාරනු ලැබේ. මෙම අංග දෙක සදාචාරය කෙරෙහි බලපාන අයුරු ද පෙන්වා දෙනු ලැබේ.

## 8.1 රාජා භවතු ධම්මිකෝ (රජ දැහැමි වේවා!)

### 8.1.1 හැඳින්වීම

"නො නසමින් නො නස්වමින්, පරාජය නො කරමින් නො කරවමින්, ශෝක නො කරමින් නො කරවමින් දැහැමින් රාජ්‍යය කළ හැකිද" යි බුදුරදුන් වරක් කල්පනා කළ බව ධර්මයෙහි සඳහන් වේ. මෙයින් පෙනී යන්නේ විවිධ දරුණු ක්‍රියා කරමින් පාලකයන් විසින් ඇතැම් විට රාජ්‍ය පාලනය කිරීම බුදුරදුන් අනුමත නොකළ බවයි. ධාර්මික ව ධර්මය අනුගමනය කරමින් රාජ්‍ය පාලනය කළ යුතු බව පිළිගත් බුදුරදුන් විවිධ සූත්‍ර දේශනාවල දී එසේ රාජ්‍ය පාලනය කළ යුතු ආකාරය පැහැදිලි කොට ඇත. මෙම පාඩම් ඒකකයෙන් අපි රාජ්‍ය පාලනය පිළිබඳ බුදුරදුන්ගේ ඉගැන්වීම් විමසා බලමු.

### 8.1.2 දස සක්විති වත්

පෙර දළ්හනේමි නම් සක්විති රජ තම වැඩිමහල් පුත්‍රයාට රාජ්‍යය පවරා තපසට ගිය කල්හි, සක්විති රජුගේ රාජ්‍ය සංකේතය වූ චක්‍රරත්නය අතුරුදහන් විය. මේ බව පියරජුට දැන් වූ විට හෙතෙම තම පුත්‍රයා අමතා කීවේ " දරුව, මෙම චක්‍රවර්ති රාජ්‍යය ඔබට පිය උරුමය ලෙස ලැබෙන්නක් නොවේ; ඔබ ඒ සඳහා නිසි පිළිවෙත් පුරා සුදුස්සෙකු විය යුතු ය" යනුවෙනි. එසේ කියා සක්විති රජකම නැවත ලබා ගැනීම සඳහා ඔහු විසින් පිරිය යුතු වත් (ප්‍රතිපත්ති) දහයක් පෙන්වා දුන්නේය. ඒවා මෙසේ ය:

1. ඔබ ධර්මය ඇසුරු කරමින්, ධර්මයට සත්කාර කරමින්, ධර්මයට ගරු කරමින්, ධර්මයට බුහුමන් කරමින්, ධර්මය පුදමින්, ධර්මයට ම යටහත් පැවැත්ම දක්වමින්, ධර්මය ධජයක් සේ පෙරටු කොට, ධර්මය කුන්තයක් සේ ඔසවාගෙන, ධර්මය ඔබගේ ස්වාමියා ලෙස ගෙන: ඔබගේ අඹු දරුවන් ඇතුළු ඇතුළත ජනයාට ධාර්මික රැකවරණය සලසන්න.
2. ඔබ ධර්මය ඇසුරු කරමින්, ... ඔබගේ බළ සෙනගට ධාර්මික රැකවරණය සලසන්න.
3. ඔබ ධර්මය ඇසුරු කරමින්, ... ඔබගේ සේවයෙහි නියුතු රජ දරුවන්ට රැකවරණය සලසන්න.

4. ඔබ ධර්මය ඇසුරු කරමින්, ... බ්‍රාහ්මණයන්ට හා ගෘහපතියන්ට රැකවරණය සලසන්න.
5. ඔබ ධර්මය ඇසුරු කරමින්, ... ගම් වැසියනට හා ජනපද වැසියන්ට රැකවරණය සලසන්න.
6. ඔබ ධර්මය ඇසුරු කරමින්, ... ශ්‍රමණ බ්‍රාහ්මණයන්ට රැකවරණය සලසන්න.
7. ඔබ ධර්මය ඇසුරු කරමින්, ... තිරිසනුන් හා පක්ෂීන්ට රැකවරණය සලසන්න.
8. ඔබගේ රාජධානියෙහි අධාර්මික ක්‍රියා සිදුවීමට ඉඩ නො තබන්න.
9. ඔබගේ රාජධානියෙහි සිටින දිළින්දන්ට ධනය දෙන්න.
10. ශ්‍රමණ බ්‍රාහ්මණයන් කරා එළඹ යහපත හා අයහපත ගැන විමසන්න.

මෙම දස සක්විති වත් පුරන විට චක්‍රවර්ති රාජ්‍යය සංකේතවත් කරන චක්‍ර රත්නය නැවත පහළ වූ බව සඳහන් ය.

දස සක්විති වත්වල දක්නට ලැබෙන අගනා ම කරුණ නම් ධර්මය කෙරෙහි කරනු ලබන අවධාරණයයි. ධර්මයෙන් තොර ව රාජ්‍ය පාලනයක් නොමැති බව ඉන් අවධාරණය කෙරේ. අප මෙම පාඩම් ඒකකයෙහි තේමාව ලෙස ගත් "**රාජා භවතු ධම්මිකො**" යන්නෙන් දැක්වෙනුයේ ද මෙහි සඳහන් පරිදි ධර්මයට අනුගත වීමයි. එසේ අනුගත ව දැහැමි ආරක්ෂාව සැලසිය යුතු ජන කොටස් හත තුළට තම පවුලෙහි සාමාජිකයන්ගෙන් පටන් ගෙන තිරිසන් සතුන් තෙක් රාජධානියෙහි වෙසෙන සියලු සත්ත්වයන් අයත් කොට ඇත. **කරණීයමෙත්ත සූත්‍රයෙහි** දක්වන ලද ආකාරයෙන් සියලු සත්ත්වයන් (**සබ්බෙ සත්තා**) රජුගේ රැකවරණයට පාත්‍ර වන බව මින් පැහැදිලි වේ. තිරිසන් සතුන් ද මෙහි ඇතුළු කිරීම ඉතා පුළුල් මෛත්‍රී සහගත මානසික ආකල්පයක් නිරූපනය කරන්නකි. මෙම සියලු කොටස්වලට ආහාරපාන, වස්ත්‍ර හා නිවාස ආදී අවශ්‍යතා සැපයීමට අමතරව කායික ආරක්ෂාව සැලසීම ද ධාර්මික රැකවරණයට අයත් ය. අටවන කරුණෙන් අවධාරණය කෙරෙනුයේ රජු තමා ධාර්මික වන අතර ම තම රාජධානියෙහි වැස්සන් ද ධාර්මික බවට පත් කළ යුතු බවයි. නව වැන්නෙන් රාජ්‍ය පාලකයකු සතු සුභසාධක සේවා ඉටු කිරීමේ අවශ්‍යතාව අවධාරණය කෙරේ. සුභසාධක පියවර ගැනීම ඉක්මන් අවශ්‍යතාවක් වුව ද පාලකයකුගේ දීර්ඝකාලීන ආර්ථික ප්‍රතිපත්තිය විය යුත්තේ, කෘෂිකර්මයෙහි යෙදෙනු කැමැති අයට බීජ හා අනිකුත් පහසුකම් ද, ව්‍යාපාර කරනු කැමැති අයට මූලධනය ද රාජ්‍ය සේවයෙහි යෙදෙනු කැමැති අයට ආහාර හා වේතන ද ලබා දීම මගින් ඔවුන් ආර්ථික වශයෙන් ස්වාධීන කිරීම බව **කූටදන්ත සූත්‍රයෙහි** සඳහන් වේ. ඒ බව අප මෙහි දී මතක තබා ගත යුතු ය. අවසාන කරුණ මගින් කියැවෙන්නේ තම රටෙහි සිටින සිල්වත් උගත් පැවිද්දන් වෙත එළඹ ඔවුන්ගෙන් පාලනය පිළිබඳ උපදෙස් ගත යුතු බවයි.

රාජ්‍යය යනු පිය උරුමයෙන් නො ලැබෙන්නක් ලෙසත්, ඒ සඳහා පාලකයා සුදුසු විය යුතු බවටත් මෙහි එන අනතුරු හැඟවීම පාලකයා තුළ නිවැරැදි ආකල්ප ඇති කරවන්නකි. මෙම ඉගැන්වීමෙහි අදහස වන්නේ පාලකයා ඒ සඳහා සුදුසු වන්නේ ධාර්මික ව එහි යෙදෙන තෙක් පමණක් බවයි. රජු දස සක්විති වතෙන් ඉවත් වූ විගස රාජ්‍යය පාලනය කිරීමේ අයිතිය ද අහෝසි වී යයි. මෙම ඉගැන්වීම ඇතුළත් **චක්කවත්ති සීහනාද සූත්‍රයෙහි** ඉන්පසු දිගට විස්තර කොට ඇත්තේ රජවරුන් මෙම වත් අත්හැර දමා අධාර්මික වන විට ක්‍රමයෙන් මුළු මහත් සමාජය ම ආයුෂයෙන් හීන වී ගොස් විනාශ වන ආකාරයයි. පිය උරුමයෙන් රාජ්‍යය ලබා ගත් පාලකයන් සිටි අවධියක බුදුරදුන් මෙම ඉගැන්වීමෙන් දෙන නිර්භීත පණිවුඩය කොතරම් වටින්නේ ද යනු ඔබට වැටහෙනු ඇත.

### 8.1.3 දසරාජ ධර්ම හා වෙනත් කරුණු

රාජ්‍ය පාලනය දැහැමි ව කළ යුතු බව ධර්මයෙහි අවධාරණය කෙරේ. මෙහි ලා අදාළ වන ඉතා වැදගත් කරුණක් නම් **දස රාජ ධර්ම** යනුවෙන් දක්වා ඇති ප්‍රතිපත්ති දහයයි. එනම් i. දානය, ii. ශීලය, iii. පරිත්‍යාගය, iv. ඍජු බව, v. මෘදු බව, vi. තපස (සංවරය), vii. ක්‍රෝධයෙන් තොර ස්වභාවය (මෛත්‍රිය), viii. හිංසාවෙන් තොර ස්වභාවය (අවිහිංසා), ix. ඉවසීම හා x. නොගැටීම (අවිරෝධතා) යි. මෙහි පරිත්‍යාගය නම් තම සැප සම්පත්, කාලය, ධනය ආදිය රටවැසියා වෙනුවෙන් අත්හැරීමට හැකිවීමයි. නො ගැටීම නම් තමාගේ මතයට

පටහැනි මත දරන්නන් හා නොගැටී අවබෝධයෙන් යුතු ව ක්‍රියා කිරීමයි. මෙම සියලු කරුණු එකට ගෙන බලන විට පෙනී යන්නේ ආදර්ශවත් පාලකයකු තුළ තිබිය යුතු මූලික ගුණාංග මෙහි අන්තර්ගත වන බවයි.

රාජ්‍ය පාලකයකු තුළ පමණක් නොව මහජනතාව සමග කටයුතු කරන ඕනෑ ම කෙනකු වෙත පැවැතිය යුතු ගුණාංග ලෙස දානය, ප්‍රිය වචනය, සමානාත්මතාව හා අර්ථචර්යාව යන **සතර සංග්‍රහ වස්තු** ධර්මයෙහි දක්වා ඇත. එසේ ම පාලකයන්ට වඩාත් අදාළ වන කරුණක් වන **අගති** හෙවත් අසාධාරණ හැසිරීම් සතරක් ද ධර්මයෙහි දක්වා ඇත. එනම්, ඡන්ද (කැමැත්ත), ද්‍වේෂ (තරහ), භය (බිය) හා මෝහ (මුළාව) යන කරුණු හේතුවෙන් අසාධාරණ ව හැසිරීමෙන් පාලකයා වැළකිය යුතු බවයි.

බුදුරදුන් විසින් වජ්ජි රජ දරුවන්ට දේශනා කළ **සප්ත අපරිහාණීය** ධර්ම (නො පිරිහීමට හේතු වන කරුණු සත) මනා රාජ්‍ය පාලනයට ඉවහල් වේ. ඒවා නම්, i. නිතර රැස්වීම, ii. සමගිව රැස්ව, සමගිව සාකච්ඡා කොට, සමගිව විසිර යාම, iii. පෙර නො පැණ වූ නීති නො පැණවීම හා පණවා ඇති නීති උල්ලංඝනය නො කිරීම, iv. වැඩිහිටියන්ට ගරු කිරීම හා ඔවුන්ගේ අදහස්වලට ඇහුම්කන් දීම, v. කාන්තාවන්ට ආරක්ෂාව සැලසීම හා බලහත්කාරකම් නො කිරීම, vi. රාජධානියෙහි ඇති පූජනීය ස්ථාන ආරක්ෂා කිරීම හා නඩත්තු කිරීම, හා vii. රාජධානියට පැමිණෙන හා එහි වෙසෙන පූජ්‍ය පක්ෂයට සංග්‍රහ කිරීම යන කරුණු ය. මෙම ධර්ම පිළිපැදීමෙන් වජ්ජීන් ඉතා ප්‍රබල පිරිසක් වූ බවත්, පසුකාලයෙහි ඒවායින් බැහැර වීමෙන් ඔවුන් පරිහානියට පත් වූ බවත් ධර්මයෙහි සඳහන් ය. වර්තමානයෙහි පවා මෙම ගුණ ධර්ම යහපත් රාජ්‍ය පාලනයක් සඳහා ඉවහල් වන බව කිව හැකි ය.

### 8.1.4 සාරාංශය

මෙහි දක්වන ලද දස සක්විති වත්, දසරාජ ධර්ම, සතර සංග්‍රහ වස්තු, සතර අගති හා සප්ත අපරිහාණීය ධර්ම යන මේ කරුණු එදාට මෙන් ම අදට ද මනා රාජ්‍ය පාලනයක් සඳහා ඉවහල් වේ. ධර්මයට හෙවත් සදාචාර පැවැත්මට මුල් තැන දෙන රාජ්‍ය පාලනය බෞද්ධ පාලන ක්‍රමය වේ. ලංකාවෙහි, ඉන්දියාවෙහි ද වෙනත් රටවල ද බෞද්ධ පාලකයන් බොහෝ දෙනකු මෙම ප්‍රතිපදාව රාජ්‍ය පාලනයේ දී අනුගමනය කොට ඇත. ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයා **"සබ්බෙ මුනිසෙ මම පජා"** "සියලු මිනිස්සු මගේ දරුවෝය" යනුවෙන් ප්‍රකාශයට පත් කළේ මෙම බෞද්ධ රාජ්‍ය පාලන සංකල්පයයි.

**අභ්‍යාස**

1. දස රාජ ධර්ම හා දස සක්විති වත් පිළිවෙළින් ලියන්න.
2. රටක සංවර්ධනය සඳහා සප්ත අපරිහානීය ධර්මවල බලපෑම පැහැදිලි කරන්න.

**පැවරුම්**

1. දස සක්විති වත් තුළට සමාජයෙහි සියලු සත්ත්වයන් අන්තර්ගත වන අයුරු පහදා දෙමින් කෙටි රචනාවක් ලියන්න.
2. ඔබ මෙහි ඉගෙන ගත් කරුණුවලින් වර්තමාන පාලකයන්ට වඩාත් ම අදාළ වන සේ ඔබ දකින කරුණු තුනක් ගෙන හැර දක්වමින් කෙටි රචනාවක් ලියන්න.

## 8.2 දැහැමි ආර්ථිකය

### 8.2.1 හැඳින්වීම

යහපත් ආර්ථිකයක් තිබීම සාර්ථක ජීවිතයක එක ම අංගය නො වුනත් මූලික අංගයක් වේ. පැවිදි ජීවිතය සම්බන්ධයෙන් බුදුරදුන් ආර්ථික අංශයක් පිළිබඳ ව සඳහන් කළේ නැතත් පැවිද්දකුට වුව ද තම ආගමික ජීවිතය පහසුවෙන් ගත කිරීම සඳහා මූලික සිවුපසය (සිවුරු, පිණ්ඩපාතය, සෙනසුන් හා ගිලන්පස) තිබිය යුතු ය. ඒවා භික්ෂූන් වහන්සේට සලසන්නේ ගිහි පිරිස බැවින් ඔවුන්ට ස්ථාවර ආර්ථිකයක් පැවතීම පැවිදි දිවියෙහි යහ පැවැත්මට ද හේතු වේ. ස්ථාවර ආර්ථිකයක් නැති පුද්ගලයකුට තම ආගමික යුතුකම් හෝ වෙනත් යුතුකම් හෝ ඉටු කිරීමට නො හැකි ය.

ආගමික යුතුකම් ඉටු කිරීම යනු සදාචාරයෙහි ම අංගයක් ලෙස ගත් කල්හි ස්ථාවර ආර්ථිකයක් නැති තන්හි සදාචාර සම්පන්න වීම දුෂ්කර බව පැහැදිලි ය. ආර්ථිකය හා සදාචාරය අතර ඇති මෙම සමීප සම්බන්ධය වරක් බුදුරදහු ආදර්ශයක් මගින් මෙසේ විදහා දැක්වූහ. දිනක් බුදුරදුන් ධර්ම දේශනා කිරීමට සැරසෙද්දී දහම් ඇසීමට සූදානම් ව සිටි පිරිසෙහි කෙනකු අධික කුස ගින්නෙන් පෙළෙමින් සිටින බව උන්වහන්සේට පෙනී ගියේ ය. දහම් අවබෝධ කිරීමට ශක්තිය තිබුණ ද අධික කුසගින්න හේතුවෙන් ඔහුට ධර්මය කෙරෙහි සිත යොමු කිරීමට නො හැකි බව දුටු බුදුරදහු ප්‍රථමයෙන් ඔහුට ආහාර දෙවා කුසගින්න නිවීමට සලස්වා අනතුරුව දහම් දෙසූහ. මෙහි දී කුසගින්න අයහපත් ආර්ථිකය ලෙසත් දහම් ඇසීම සදාචාරය ලෙසත් ගතහොත් පැහැදිලි වන්නේ ආර්ථිකයෙන් තොරව සදාචාරය (නො හැකි බව නොව) දුෂ්කර බව යි.

දිළිඳු බව ලෝකයෙහි දුකක් බව පෙන්වා දුන් බුදුරදුන් තම උපාසක උපාසිකා ශ්‍රාවක පිරිසට යහපත් ආර්ථිකයක් ඇති කර ගන්නා අයුරු විවිධ අවස්ථාවල දී පෙන්වා දුන්හ. මෙම පාඩම් ඒකකයෙන් අපි එම ඉගැන්වීම් විමසා බලමු. මෙහි දී ඒවා ධනය ඉපයීම, රක්‍ෂණය හා පරිභෝජනය යනු කරුණු යටතෙහි සාකච්ඡා කරනු ලැබේ.

### 8.2.2 ධනය ඉපයීම

බුදුරදුන් දවස ඉන්දියාවේ පැවැති කෘෂිකර්මය, ගව පාලනය, වෙළෙඳාම (ව්‍යාපාර) හා රාජ්‍ය සේවය ආර්ය ශ්‍රාවක පිරිසට උචිත රැකීරක්ෂා ලෙස ධර්මයෙහි සඳහන් කොට ඇත. වෙළෙඳාම් සම්බන්ධයෙන් කිරුම්, මිනුම් ආදියෙන් වංචා කිරීමෙන් ද මස්, විස, ආයුධ, මත්පැන් හා සත්ත්වයන් වෙළෙඳාම් කිරීමෙන් ද වැළකිය යුතු බව ධර්මයෙහි සඳහන් ය. එහෙත් පොදුවේ සියලු ම රැකියාවලට අදාළ ව දක්වා ඇත්තේ **ධම්මිකෙන ධම්මලද්ධෙන** යනුවෙන් "ධාර්මික ව ධර්මයෙන් උපයාගත්" යන්න යි. උත්සාහයෙන්, වීර්යයෙන්, දැතේ ශක්තියෙන්, දහදිය වගුරුවා **ධර්මානුකූල ව** ධනය ඉපයිය යුතු බව ධර්මයෙහි පෙන්වා දේ. එහෙත් සියලු නිවැරැදි ධන උපයන මාර්ග සඳහා ශරීරය වෙහෙසීම අවශ්‍ය නො වන බැවින් මෙහි දී වැදගත් ම කරුණ ලෙස ගත යුතු වන්නේ ධර්මානුකූල බවයි.

රාජ්‍ය පාලනයේ දී මෙන් ම ආර්ථිකයේ දී ද වැදගත් වන්නේ ධර්මය උල්ලංඝනය නො කිරීමයි. ගිහියකුට ලැබිය හැකි ලෞකික සැප සතරක් ගැන දේශනා කොට ඇති තැනක සිවු වැන්න සේ දක්වා ඇත්තේ **අනවජ්ජ සුඛ** හෙවත් ධනය ඉපයීමේ දී අනුගමනය කළ යුතු නිවැරැදි ක්‍රමය හේතු කොට ගෙන ඇතිවන සැපතයි. එනම් ධර්මානුකූල ව ධනය ඉපයීමෙන් ලැබෙන මානසික සහනයයි. **පත්තකම්ම සූත්‍රයෙහි** දී බුදුරදහු ලෝකයෙහි ඉතා සිත්ගන්නාසුලු එහෙත් ලබා ගැනීම අතිශයින් දුෂ්කර කරුණු සතරක් දක්වති. ඉන් පළමුවැන්න වන්නේ වස්තුව ධාර්මික ව ලැබීම ය. අද මෙන් ම එදාත් වස්තුව හා ධනය අධාර්මික ව ලබා ගැනීම පහසු වන්නට ඇත. **අසාහසික ව** (සහසිකත්වයෙන් තොර ව) ධනය රැස් කළ යුතු බව දේශනා කොට ඇත්තේ ද ධනය සාහසිකව පහසුවෙන් රැස් කළ පිරිස් සිටි හෙයින් විය යුතු ය. එහෙත් ශ්‍රද්ධා, ශීල, ත්‍යාග, ප්‍රඥා යන ගුණ ධර්ම වැඩීමෙන් මෙම දුර්ලභ කරුණ ලබා ගත හැකි බව උන්වහන්සේ එහි දී පෙන්වා දෙති. ඉන් අවධාරණය කෙරෙනුයේ ගුණ ධර්ම වඩන පුද්ගලයාට ධර්මය උල්ලංඝනය නො කොට වස්තුව උපයා ගත හැකි බවයි.

කෙනකුගේ මෙලොව ජීවිතයේ යහපත සඳහා හේතුවන කරුණු සතරක් දක්වන බුදුරදහු ඉන් පළමුවැන්න ලෙස **උට්ඨාන සම්පදා** නමින්, උත්සාහය දක්වති. **සිගාලෝවාද සූත්‍රයෙහි** දී බුදුරදහු කුසීත බව පරිහානියෙහි ලක්ෂණයක් ලෙස පෙන්වා දෙති. දක්ෂ ව, අනලස ව, උත්සාහයෙන් ධනය ඉපයිය යුතු බව බුදුරදහු පෙන්වා දෙති. ඒ අනුව ධනය ඉපයීමේ දී බුදුදහම දක්වන මූලික කරුණු වනුයේ, දක්ෂවීම, අනලස වීම, උත්සාහය, අසාහසික බව හා ධර්මානුකූල බවයි, ඉනුත් ධර්මානුකූල බව අන් සියල්ලට වඩා වැදගත් වේ.

### 8.2.3 ධනය ආරක්ෂා කිරීම

ඉහත සඳහන් ආකාරයෙන් උපයා ගත් ධනය විනාශ වී යා නොදී ආරක්ෂා කර ගත යුතු බව ධර්මයෙහි සඳහන් වේ. **ආරක්ඛ සම්පදා** යනුවෙන් එය දක්වා ඇත. ආරක්ෂා කිරීම යනුවෙන් මෙහි අදහස් කෙරෙනුයේ ධනය පරිභෝග නො කොට රැස් කිරීම නො වේ. ඒ බව ඉදිරියට පැහැදිලි වනු ඇත. මෙහි ආරක්ෂා කිරීම නම් රජුන්ගෙන්, සොරුන්ගෙන්, ගින්නෙන්, ජලයෙන් හෝ අප්‍රිය උරුමකම් කියන්නන්ගෙන් ආරක්ෂා කර ගැනීමයි. ස්ත්‍රීන්ට, සුරාවට, සූදුවට ලොල්වීමෙන් හා පාපමිත්‍රයන් හේතු කොට ගෙන ද ධනය විනාශ විය හැකි බැවින් ඒවායින් වැළකීම ද ධනය ආරක්ෂා කිරීම සේ සලකනු ලැබේ. මෙම ධන විනාශ දොරටු හේතුවෙන් පුද්ගලයා පිරිහෙන බව බුදුරදුන් පරාභව සූත්‍රයෙහි දී පෙන්වා දී ඇත. **සිගාලෝවාද සූත්‍රයේ දී** බුදුරදුන් "භෝග අපාය මුඛ" හෙවත් වස්තුව විනාශ වන දොරටු හයක් දක්වා ඇත. ඒවා නම්, මත්පැන් පානය, නො කල්හි වීදි සංචාරය, සන්දර්ශන බැලීමට ලොල්වීම, සූදුවට ලොල්වීම, පාප මිත්‍රයන් ඇසුර හා අලස බවයි.

ඉහත සඳහන් ධනය විනාශ වීම වළකන කරුණුවලට අමතර ව එය ආරක්ෂා කර ගැනීම සඳහා හේතු වන තව ද කරුණු දෙකක් බුදුරදුන් දක්වා ඇත. එනම්, **කල්‍යාණ මිත්තතා** හෙවත් යහපත් මිතුරන් ඇති බවත්, **සමජීවිකතා** හෙවත් අය අනුව වැය කරමින් මධ්‍යස්ථ ජීවිතයක් ගත කිරීමත් ය. මේ අනුව බුදුරදුන් ධනය විනාශයේ දොරටුවලින් බේරා ගැනීමට ද යහපත් මිත්‍රයන් හා බුද්ධිමත් අය වැය පාලනය මගින් ආරක්ෂා කර ගැනීමට ද අපට උපදෙස් දී ඇත.

### 8.2.4 ධනය පරිභෝග කිරීම

ගිහියකුහට අත් විඳිය හැකි සැප හතරක් බුදුරදුන් දක්වා ඇති බව ඉහත සඳහන් කරන ලදී. ඉන් අවසනට දක්වා ඇති අනවජ්ජ සුඛය ද කලින් සඳහන් කරන ලදී. අනිකුත් සැප තුන නම් : i. **අත්ථි සුඛ** හෙවත් ධනය තිබීමෙන් කෙනකුට ඇතිවන සතුට, ii. **භෝග සුඛ** හෙවත් ධනය පරිභෝජනය කිරීමෙන් ඇතිවන සැපත සහ iii. **අනණ සුඛය** හෙවත් ණය නැති කම හේතුවෙන් සිතෙහි ඇතිවන සුවයයි. මෙයින් තෙවැන්න මානසික සුවයකි. මුල් කරුණු දෙක වස්තුව හෝ ධනය අවශ්‍ය පරිදි, අවශ්‍ය විට ප්‍රමාණවත් ව තිබීමෙන් හා පරිභෝගයට ගැනීමෙන් ඇතිවන සතුටයි. එය කායික ද මානසික ද වේ.

මෙහි දී අප විසින් සැලකිය යුතු වැදගත් කරුණක් නම් බුදුසමය අත්ථි සුඛය ගැන පමණක් කතා නො කරන බවයි. අත්ථි සුඛය අර්ථවත් වන්නේ භෝග සුඛයෙන් හෙවත් පරිභෝජනය කිරීම තුළිනි. ධනය පරිභෝජනය කළ යුතු අයුරු බුදුරදහු පත්තකම්ම සූත්‍රයේ දී මෙසේ පහදා දෙති:

(1) තමා උත්සාහයෙන්, දහඩිය මහන්සියෙන්, බාහු බලයෙන් ධාර්මික ව රැස්කර ගත් ධනයෙන් i. තමා සැප විඳියි, ii. මවුපියන් සැපවත් කරයි, iii. අඹුදරු, දාසිදස් කම්කරුවන් සැපවත් කරයි, iv. මිත්‍රයන් සැපවත් කරයි.

(2) ගින්නෙන්, දියෙන්, රජුන්ගෙන්, සොරුන්ගෙන් හෝ අප්‍රිය උරුමකරුවන්ගෙන් විය හැකි හානි වළකාලීමට ධනය යොදා ගනියි.

(3) ඥාති බලි හෙවත් නෑයන් වෙනුවෙන් පවත්වන පූජා, ආගන්තුකයන්, අතීතයෙහි මියගිය අය, රජවරු හා දේවතාවන් යන පිරිස් වෙනුවෙන් කළ යුතු පූජා සඳහා ධනය යොදවයි.

(4) ගුණධර්ම වඩන මහණ බමුණන් වෙත දන්දීම සඳහා ධනය යොදවයි.

මෙම සතර ආකාර ධන වියදම කෙනකු විසින් කළ යුතු කාර්යය (පත්තකම්ම) වේ. එසේ ම ඒවා සඳහා වියදම් කිරීම මගින් ධනය නිවැරදි හා උචිත ආකාරයෙන් පරිභෝග කළා වේ. ධනය ඇති තමා වෙත පැමිණි මහණ බමුණන්ට සත්කාර නො කරන්නා ද, ධනය ඇති කල්හි තම අඹුදරුවන් පෝෂණය නො කරන්නා ද වසලයකු බවත් එම හැසිරීම් පිරිහීමට හේතුවන බවත් බුදුරදුන් විසින් දේශනා කොට ඇත. සගාලෝවාද සූත්‍රයෙහි දක්වන ලද මවුපියන් ආදී දිශා සයට නමස්කාර කිරීමේ ක්‍රියාවලියේ අනිවාර්ය අංගයක් වනුයේ තම ධනය ඔවුන්ගේ අවශ්‍යතා සඳහා වියදම් කිරීම වේ. මෙම සියල්ලෙන් පැහැදිලි වනුයේ ධනයෙහි අර්ථය නම් එක්රැස් කොට ගොඩගසා තබා ගැනීම නොව බෙදාහදා ගැනීම සහ පරිභෝජනය කිරීම බවයි.

### 8.2.5 සාරාංශය

ධනය මනුෂ්‍යයාට ඔහුගේ එදිනෙදා කාර්ය සඳහා අවශ්‍ය බවත් එය නිවැරදි ව, ධාර්මික ව උපයා ගෙන තමාගේත් තමා හා සම්බන්ධ සමාජයේත් ප්‍රයෝජනය සඳහා යෙදිය යුතු බවත්, එසේ කිරීම බෞද්ධ ආගමික පරමාර්ථ හා නො ගැටෙන බවත් ඉහත සඳහන් විස්තරය අනුව අපට නිගමනය කළ හැකි ය. එහෙත් බෞද්ධ අපගේ අවසන් ආගමික පරමාර්ථය අනුව බලන විට වඩා වැදගත් වන්නේ ශ්‍රද්ධා, සීල, හිරි, ඔත්තප්ප, සුත, චාග, පඤ්ඤා යන මේ **සප්ත ආර්ය ධනය** බව සඳහන් කළ යුතු ය.

**අභ්‍යාස**

1. ගිහියකු විසින් විඳිය හැකි සැප 4 නම් කරන්න.
2. නිවැරදි ධන පරිහරණය සඳහා පත්තකම්ම සූත්‍රයෙන් දී ඇති උපදෙස් පිළිවෙළින් ලියන්න.

**පැවරුම්**

1. ආර්ථිකය හා සදාචාරය අතර සම්බන්ධයක් තිබේ යැයි ඔබ පිළිගන්නෙහි ද? කෙටි රචනයක් ලියන්න.
2. ධනය ඉපයීමේ දී ධර්මානුකූල වීම යනුවෙන් අදහස් කරනුයේ කුමක්දැයි පැහැදිලි කරමින් ඡේදයක් ලියන්න.
3. බුදුදහමට අනුව ධනය යහපත් හෝ අයහපත් හෝ ලෙස විස්තර කළ හැකි ද? ඔබේ පිළිතුරු පහදා දෙමින් ඡේදයක් ලියන්න.
4. පහත සඳහන් වචනවල තේරුම් සොයා ඔබේ සටහන් පොතට එකතු කර ගන්න:
   i. උල්ලංඝනය ii. අනලස iii. ගිහියා iv. පරිභෝජනය

**අතිරේක කියවීම්**

1. ගිහි විනය (රාජකීය පණ්ඩිත වැලිගම ඤාණරතන නා හිමි)
2. දියුණුව (රාජකීය පණ්ඩිත වැලිගම ඤාණරතන නා හිමි)
3. බුදුදහමේ මූලික ඉගැන්වීම් (ධර්මසේන හෙට්ටිආරච්චි හා ගුණසේන මහතන්ත්‍රීගේ)